## 1.27 සංස්කෘත ධ්වන්‍යනුකරණ වාඞ්මාලා පිළිබඳ විමර්ශනයක්

අශෝක ගුණසේකර
සංස්කෘත අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

සංස්කෘත කාව්‍ය විචාර සංකල්පයක් වූ ධ්වනි සිද්ධාන්තයට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ඒ ධ්වනිය කාව්‍යයේ ආත්මය ලෙස නිර්වචනය වී ඇති බැවිනි. එහෙත් මෙම පර්යේෂණ කාර්යයේදී ධ්වනිවාදය හෝ ඒ හා අරබයා පැන නැගී ඇති විවේචන කෙරෙහි අපගේ අවධානය යොමුවන්නේ නැත.

සංස්කෘත සිංහල පාලි සාහිත්‍යකරුවන් ස්වකීය නිර්මාණයන්හි දී අපේක්ෂිත අර්ථ නිෂ්පත්තිය සිදු කරගැනීම සඳහා ධ්වන්‍යනුකරණාත්මක වූ වාඞ්මාලා භාවිතයට ගෙන ඇත. බොහෝ විට කිසියම් නාදයක ආකෘතිය හෝ ස්වරූපය ගෙනහැර දක්වමින් ඒ තුළින් ශබ්ද මාධුර්යයක් මෙන් ම වාච්‍යාර්ථය ඉක්මවා ගිය ධ්වන්‍යනුකරණාත්මක ( Onomatopoeia ) අර්ථ සමුදායක් ජනනය කිරීමට ඔවුන් සමත් වී ඇති බව පෙන්වා දිය හැකි ය. මෙය කවියාගේ විචක්ෂණ කුසලතාවට සාධකයක් ද වනු ඇත.

***‘ජම්බූඵලානි පක්වානි - පතන්ති විමලේ ජලේ,***
***කපිකම්පිතශාඛාභ්‍යෝ - ගුලු ගුග්ගුලු ගුග්ගුලු.***
( භොජප්‍රබන්ධ, 295 පද්‍යය )

යනු එක් නිදර්ශනයකි. වඳුරන් විසින් කම්පිත කරන ලද අතුවලින් ඉදුණු ජම්බු ඵල නිසල පිරිසිදු ජලය මත පතිත වූ ආකාරය අවසන් පද්‍ය පාඨයෙන් ප්‍රකාශිත යි. මෙහි ඇති ධ්වනි ගුණය වඩාත් තීව්‍ර වන්නේ අවස්ථා නිරූපණය හා ගළපා බැලීමෙනි. මේඝ ගර්ජනා - ජලධාරා - වර්ෂාව ආදි ස්වභාව සිද්ධ අවස්ථා නිරූපණය කිරීමේදී මෙන් ම ශුනඛ ශකුන, කාක මණ්ඩූකාදි සතුන්ගේ නාද රටා හෙළිදරව් කිරීම වැනි අවස්ථාවලදී කවීන් විසින් නිෂ්පාදිත වාඞ්මාලා හා ශබ්දරටා වචනාර්ථයට වඩා භාවාර්ථයක් ධ්වනිත කරවන ඒවා බව පෙන්වා දිය හැකි ය. එබඳු වාඞ්මාලාවන් පර්යේෂණයට ලක්කිරීමෙන් සන්නිවේදනයේ අර්ථය ප්‍රකාශයට පත්වන්නේ අර්ථයෙන් ද ශබ්දයෙන් ද යන පැනයට පිළිතුරු සොයාගත හැකි ය. එනම් භාෂාව නිෂ්පත්තිය වූයේ අර්ථය ඔස්සේ පමණක් නොව ශ්‍රැති ගෝචරාත්මක ශබ්ද රටාවන්ගෙන් බව අනාවරණය කරගත හැකි ය. නාදයක ස්වරූපය (විලාසය) කථනයේදී හෝ උස්පහත් ස්වර භේදයේදී හෝ සාමාන්‍ය ස්වර භේදයේදී වැනි විවිධ සියුම් ප්‍රභේද විෂයමූලික ලෙස විශ්ලේෂණය කළ නො හැකිය.